# 14. සාම පණිවිඩය අසමු

අක්කා : අනේ නංගී ඔය රේඩියෝව වහලා දාන්නකෝ. සද්දේ නිසා මට මගේ පොත කියවා ගන්න අමාරුයි.

නංගී : ආ එහෙම කරන්නේ කොහොම ද?
මම සිංදු අහන්න ආසයි. ගෙදර ඉන්න ටික වේලාවේ දී තමයි මට සිංදුවක්වත් අහන්න පුළුවන් වෙන්නේ.

අක්කා : කියන දේ අහන්නකො නංගී. මට ගොඩාක් දේවල් පාඩම් කරගන්න තියෙනවා. මගේ හොඳ නංගී ශබ්දය අඩු කරගන්නකෝ.

නංගී : මට බැහැ. අක්කා ඔය පොත පැත්තකට දාලා මේ සිංදු අහන්න.

අමර : මොකද, මොකද මේ කලබලේ?
අක්කයි නංගියි පොඩි රණ්ඩුවක් වගේ නේ ද?

අක්කා : බලන්න අමර, නංගී මට පාඩම් කරන්න දෙන්නේ නැහැ. සිංදු ඇසීම නවත්වන්න කිවුවට අහන්නේ නැහැ.

අමර : හා එන්න නංගී අපි එළියට ගිහින් සෙල්ලම් කරමු. අන්න කමලත් කුමාරත් එනවා. හා යමු යමු. රේඩියෝවත් එළියට ගෙනිහිං අහන්න පුළුවන්.

නංගී : හා එහෙනං අපි එළියට යමු. අක්කාට පාඩුවේ ඉන්න පුළුවනි. පාඩම් කරලා ඉවර වුණා ම අක්කත් එළියට එන්නකො.

අමර : අපි සමාදානයෙන් ප්‍රශ්න බේරා ගන්න එක කොයි තරම් හොඳද? දැන් ඉතින් කලබල කරගන්න ඕනෙ නැ නේ ද නංගී.

ජේසුස් වහන්සේ මෙලොවට ආවේ සාමයේ කුමරා හැටියටයි.

එතුමා මෙලොවෙහි දී දේශනා කළේ සාමයේ පණිවිඩයකි. සාමය අප තුළ විතරක් නොවෙයි අප හා අන් අය අතරත් ඇති කිරීම වැදගත්.

## පැවරුම්

1. පෙළ පොතේ සඳහන් සංවාදය රඟ දක්වන්න.

2. සාමයේ කුමරා ගැන ඔබ දන්නා කරුණු පහක් ලියන්න.